ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>8 වන ජාත්‍යන්තර යෝගා දිනය 2022 ජූනි 21 වන දින ශ්‍රී ලංකාවේ දී...</u>**

කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය, යාපනයේ ඉන්දියානු කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය, හම්බන්තොට ඉන්දියානු කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය සහ මහනුවර සහකාර මහ කොමසාරිස් කාර්යාලය විසින් 2022 ජූනි 21 වන දිනට යෙදෙන 8 වන ජාත්‍යන්තර යෝගා දිනය නිමිත්තෙන් දිවයිනේ විවිධ ප්‍රදේශවල වැඩසටහන් රැසක් සංවිධානය කර ඇත.

2. "මනුෂ්‍යත්වය උදෙසා යෝගා" යන තේමාව යටතේ මහ ජනතාව සඳහා විශේෂ වැඩසටහනක් එදින පෙරවරු 6 සිට කොළඹ නිදහස් චතුරස්‍රයේදී නොමිලේ පැවැත්වේ. මෙම වැඩසටහන ශ්‍රී ලංකාවේ සංස්කෘතික අමාත්‍යාංශය ඇතුළු විවිධ සංවිධාන සහ එක්ව සංවිධානය කර ඇත.

3. නැගෙනහිර සිට බටහිර දක්වා සූර්යයාගේ ගමන් මඟ හා සබැඳි "ගාඩියන් රින්ග්" නමැති නව්‍ය වැඩසටහන 8 වන ජාත්‍යන්තර යෝගා දිනයේ සුවිශේෂීම අවස්ථාව වනු ඇත. මේ සඳහා විවිධ රටවල යෝගා සඳහා උනන්දුවක් දක්වන අයවලුන් සහභාගී වනු ඇත.

4. 2014 වසරේදී ඉන්දියාව විසින් කරන ලද යෝජනාවක් අනුව එක්සත් ජාතින්ගේ මහා මණ්ඩලය විසින් සෑම වසරකම ජූනි 21 වන දින ජාත්‍යන්තර යෝගා දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මේ සඳහා රටවල් 170කට වැඩි ගණනක් සහය ලබා දුන් අතර ශ්‍රී ලංකාව ඒ සඳහා සම අනුග්‍රහය දැක්වූ පළමු රටවල් කිහිපය අතරින් එකකි.

5. ආයුර්වේදය මෙන්ම යෝගා ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ පොදු උරුමයකි. 2015 වසරේ සිට ශ්‍රී ලංකාවේ ඉන්දියානු තානාපති කාර්යාල ශ්‍රී

ලංකා නායකත්වය හා එක්ව ජාත්‍යන්තර යෝගා දිනය මහත් උනන්දුවකින් සමරා ඇත. පසුගිය වසර කිහිපය මුළුල්ලේම එම වැඩසටහන් සඳහා දහස් ගණන් ජනතාව සහභාගී වී ඇත. කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පැවති සීමා හේතුවෙන් 2020 සහ 2021 වසර වලදී අතථ්‍ය ආකාරයෙන් පැවති වැඩසටහන් සඳහා ද ජනතාව දැඩි උනන්දුවකින් සහභාගී විය.

* * *

කොළඹ
2022 ජූනි 17